Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ - 01 සේවා ගණයේ (MN 06 - 2006A) මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2021**

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ - 01 සේවා ගණයට (MN 06 -2006 A ) අයත් මනෝ විද්‍යාඥ තනතුරේ II ශ්‍රේණියේ තනතුරු 07ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

2.1 *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමග මනෝ විද්‍යාව සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන සමාර්ථයක් ලබා තිබීම.

2.2 *වෘත්තීය සුදුසුකම් :*
රජයේ පිළිගත් වෛද්‍ය ආයතනයක සායනික මනෝ විද්‍යාව පිළිබඳ (Clinical Psychology) වසර 02ක පුහුණුවක් ලබා තිබීම;

*සහ*

මනෝ වෛද්‍ය විශේෂඥවරයෙකුගේ අධීක්ෂණය යටතේ මාස (06) ක පුහුණුවක් ලබා තිබීම.

2.3 *කායික සුදුසුකම්*
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.4 *වෙනත් සුදුසුකම් :*
- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

04. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 36,585 - 10 x 660 - 11 x 755 x 15 x 930 - 65,440 (MN- 06-2016(ඒ)) වේ.

05. *ලිඛිත පරීක්ෂණය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශ* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යාව හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ දැනුම | මානසික සෞඛ්‍ය හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. | පැය 03 | 100 | 40% |

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීනතාවය සම්පූර්ණ කළ යුතුය.

IV. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

07. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.03.05 වේ. අයදුම්පත් 2021.03.05 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (පාලන) 07,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 වන පිටුව අංක 07 සිට 10 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "**මනෝ විද්‍යාඥ තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා අයදුම්පත්‍රය**" යනුවෙන් සඳහන් කළ යුතුයි.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු කටයුතු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත.එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. විභාග ගාස්තුව රු.500.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්" නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය (මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ). විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයේ අංක 09 යටතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතීඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදා අධිකාරීලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 273,060/= කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

VII. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

VIII. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. සුදුසුකම් ලැබූවන් විභාග යට කැඳවනු ලබන අතර ඒ බව සති දෙකකට ප්‍රථම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.)

08. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ලිඛිත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ග යන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.
- මෙම පත්කිරීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධරයා සතු වේ.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්.

2021 ජනවාරි මස 20 වැනි දින දීය.
සෞඛ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2021

විභාගය සඳහා ඉදිරිපත් වන මාධ්‍යය : (සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ - T) ☐

පදිංචි දිස්ත්‍රික්කය : ☐

1. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Mr./~~Mrs. /Miss.~~ SILVA A. B.
Mr./Mrs./Miss.....................................................................................

1.2 සම්පූර්ණ නම :........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................

1.3 සම්පූර්ණ නම :........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................

2. 2.1 ලිපිනය (පෞද්ගලික) :........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) :........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................

2.3 ලිපිනය (රාජකාරි) :........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................

2.4 ලිපිනය (රාජකාරි) :........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................
(ලිපිනයෙහි වෙනසක් වේනම් එය වහාම දැන්විය යුතුය.)

2.5 දුරකතන අංකය (පෞද්ගලික) :........................................................................
2.6 දුරකතන අංකය (කාර්යාලීය) :........................................................................
2.7 විද්‍යුත් තැපැල් ලිපිනය (email address) :........................................................................

3. 3.1 උපන් දිනය :

☐☐☐☐ වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස -: අවු:..........මාස:.......... දින:.....

4. ජාතික හැඳුනුම්පත් අංකය :..............................

5. ස්ත්‍රී/පුරුෂ භාවය :..............................

6. සුදුසුකම් :
6.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :
:........................................................................................
........................................................................................

6.2. වෘත්තීය සුදුසුකම් ඃ

:..........................................................................................

:..........................................................................................

7. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :..............................

7.2. ලදුපත් අංකය හා දිනය :..............................

7.3. ගෙවූ මුදල :..............................

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 500.00 ක මුදල ගෙවා ලබාගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

8. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුව හොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය ඃ................................

.........................................
අයදුම්කරුගේ අත්සන.

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය ඉදිරිපිටදී .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

..................,
සහතික කරන්නාගේ අත්සන.
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

සම්පූර්ණ නම :..............................

තනතුර :..............................

ලිපිනය :..............................

10. දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය -ඃ (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)

මෙම ඉල්ලුම්කරු වන.................................................................................මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ .............................................වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද.........................දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

..............................,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :..............................

පදවි නාමය :..............................

දිනය :..............................

දෙපාර්තමේන්තුව /ආයතන :..............................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)